
# Invited Strangers
# ආරාධිත අමුත්තෝ



චිත්‍රය - තලන්ගම

**දි**නක් එක්තරා කාන්තාවක් ගෙයින් එළියට ආ මොහොතක දුටුවේ ගෙයි මිදුලේ තනා ඇති ලී බංකුවක් උඩ වාඩි වී සිටින වයසක මිනිසුන් තිදෙනෙකි. මනාව හැඳ පැළඳ සිටි ඔවුන්ට මුහුණ පුරා වැඩුණු රැවුල්ද තිබුණි. ඒ අය කවුරුන්දැයි නොදන්නා නමුත් ඇය ඔවුනට මෙසේ කීවා ය.

"මම දන්නෙ නෑ ඕගොල්ල කවුද කියලා..... නමුත් මට පේනව කාටත් බඩගිනි බව.... එන්න කට්ටියම ඇතුළට.... ඇවිත් මොනව හරි කන්න....."

"ගෙදර අයිතිකාර මහත්තෙයා ඉන්නවද.....?" ඔව්හු ඇසූහ.

"නෑ........" ඇය පිළිතුරු දුන්නා ය. "අපේ එක්කෙනා ටිකකට එළියට ගියා......"

"එහෙනම් අපි ගෙට එන එක හරි නෑ.... බොහොම ස්තුතියි කළ ආරාධනාවට....අපි ටිකක් මෙහෙම ඉඳලා යනවා...." ඔව්හු කීහ. කාන්තාව ද ආපසු ගෙට ගියා ය.

එදින හවස සැමියා ගෙදර පැමිණි විට ඇය ඔහුට මහළු මිනිසුන් තිදෙන ගැන කීවා ය.

"තවම ඉන්නවද බලන්න...." ඔහු කීවේ ය. "ඉන්නව නම් ගෙට එන්න කියන්න.... මම ආව කියලා කියන්න....."

කාන්තාව එළියට ගොස් බලද්දී මහළු මිනිස්සු තිදෙන තවමත් එහි වූහ. ඇය ඔවුන්ට ගේ තුළට එන ලෙස ආරාධනා කළා ය.

"අපි තුන්දෙනාම එක සැරේ ගෙදරකට යන්නෙ නෑ...." ඔව්හු එක හඬින්ම කීහ.

"ඇයි ඒ ....? " ඇය ඇසුවා ය.

"එහෙම තමයි අපේ සිරිත...."

එසේ කියමින් මහලු මිනිසුන් තිදෙනගෙන් එක් තැනැත්තෙක් තම සගයන් ද, තමා ද හඳුන්වා දුන්නේ මෙසේ ය.

"මෙයාගෙ නම වස්තුව..." ඔහු එක් අයෙකුට ඇඟිල්ල දික්කරමින් කීය. අනෙකා පෙන්වමින් "අර ඉන්නෙ සමෘධිය හෙවත් සාර්ථකත්වය...." යනුවෙන් කීවේ ය.

ඊළඟට තමා වෙතට ඇඟිල්ලෙන් ඇන ඔහු මෙසේ කීවේය. "ආදරය තමයි මගේ නම....... වස්තුව...., සමෘධිය...... ආදරය.... ඒ තමයි අපි තුන්දෙනා... දැන් ගෙට ගිහින් ඔබගේ සැමියාත් සමග කතා බහ කරලා අපට ඇවිත් කියන්න, අපි තුන්දෙනා ගෙන් කොයි කෙනාටද ගෙට එන්න ආරාධනා කරන්නෙ කියලා...."

කාන්තාව ගෙතුළට ගියා ය. මහළු මිනිසුන් ගේ කතා බහ සියල්ල ඇය සැමියාට විස්තර කළා ය.

ඒ අසා සන්තෝෂයෙන් ඉපිල ගිය ඔහු "ෂා.... හරි අපූරුයි...." යනුවෙන් කීය. "හොඳයි එහෙම නම් අපි වස්තුවට ගෙට එන්න කියමු. එත කොට මේ ගෙදර වස්තුවෙන් පිරියාවි. ඒක මම කවදත් ප්‍රාර්ථනා කළ දෙයක්. වස්තුව.... හා හා... වස්තුව... ඒ තමයි අපට දැනට ඉතාම අවශ්‍යම දේ..."

එහෙත් ඔහුගේ බිරිඳ එයට හරස් වූවා ය. "මම නම් කියන්නෙ වස්තුවට නෙවෙයි... සමෘධියට ආරාධනා කරන්න කියලා.... සමෘධිය හොඳයි.... අපි සමෘධියට කියමු ගෙට එන්න කියලා....."

මේ කතා බහ අසාගෙන ඒ ගෙදරම කාමරයක සිටියේ එම දෙමහල්ලන්ගේ පුතා හා විවාහව සිටි තරුණියයි. එනම් ලේලියයි. ඇය ඉදිරියට විත් මෙසේ කීවා ය.

"මට ඇහුණ කතාව...... මාමණ්ඩී... නැන්දම්මේ...... අපි ආදරයට ගෙට එන්න කියමු.... එතකොට මේ ගේ ආදරයෙන් පිරිලා යාවී.... ආදරය තියනව නම් මට වෙන කිසි දෙයක් ඕන නෑ....... අනේ අපි ආදරයට ගෙට එන්න කියමු...."

දෙමහල්ලෝ මඳක් එකිනෙකාගේ මුහුණ බලා සිටියෝය. අවසානයේ ගෙහිමියා බිරිඳට මෙසේ කීවා ය.

"හොඳයි අපි මේ කෙල්ල කියන දේත් අහමු.... මේ ගොල්ල තාම තරුණ අය නෙව.... එහෙනම් ඔයා ගිහිං කියන්න ආදරයට ගෙට එන්න කියලා........"

කාන්තාව එළියට ගොස් අමුත්තන් හමුවූවා ය.

"අපි තීරණය කළා මෙහෙම...... මෙතන කොයි එක්කෙනාද ආදරය. අන්න එයාටයි ආරාධනාව......" ඇය ඔවුන්ට පැවසුවා ය.

ආදරය වාඩිවී හුන් තැනින් නැගිට ගේ දෙසට යත්ම අනෙක් මහල්ලන් දෙදෙනද නැගිට ඔහු පසුපස ගෙට යන්නට සැරසුණාහ.

"මේ මොකද මේ......" කාන්තාව ඇසුවා ය. "මම ආදරයට විතරයි එන්න කිව්වෙ. අනික් දෙන්නට නෙවෙයි......."

එවිට වස්තුව හා සමෘධිය දෙදෙනම එක හඬින් මෙසේ කීහ.

"අපි දෙන්නගෙන් එක්කෙනෙකුට එන්න කිව්ව නම් අපි එන්නෙ තනියම...... ඒත් මේ ආදරය යම් තැනකට යනව නම් එතැනට අප දෙන්නාත් අනිවාර්යයෙන්ම යනවා. ඒකෙ හැටි එහෙමයි......."

ආදරය ඇති තැනට වස්තුවත්, සමෘධියත් නොවැරදීම පැමිණෙන බව ඔබත් මතක තබාගන්න...!

♦ **දීපා සඳමාලි හේරත්**
**USA**

A woman came out of her house and saw 3 old men with long white beards sitting in her front yard. She did not recognize them. She said " I don't think I know you, but you must be hungry. Please come in and have something to eat."

" Is the gentleman of the house home...? ", they then asked.

" No", she said. " He's out."
" Then we cannot come in ", they replied.

In the evening when her husband came home, she told him what had happened.

" They could still be there....Go tell them I am home and invite them in ! "

The woman went out and invited the men in.

" We do not go into a House together," they politely replied.

" Why is that....? " she asked.

One of the old men explained:
" His name is Wealth," he said pointing to one of his friends, and said pointing to another.... " He is Success, and I am Love." Then he added, " Now go in and discuss with your husband which one of us you want in your home."

The woman went in and told her husband what was said. Her husband was overjoyed. " How nice...!", he said. " Since that is the case, let us invite Wealth.... Let him come and fill our home with wealth....Oh! dear....how nice...!"

His wife disagreed. " Darling why don't we invite Success...I like Success....? "

At this moment their daughter-in-law was listening from the other corner of the house. She jumped in with her own suggestion: " Would it not be better to invite Love? Our home will then be filled with love! Or it'll be wonderful..."

" Let us heed our daughter-in-law's advice," said the husband to his wife. " It's not a bad idea. Go out and invite Love to be our guest."

The woman went out and asked the 3 old men, " Which one of you is Love? Please come in and be our guest......"

Love got up and started walking toward the house. Then other 2 also got up and followed him. Surprised, the lady asked Wealth and Success:
" I only invited Love, Why are you coming in..?"

The old men replied together: " If you had invited Wealth or Success, the other two of us would've stayed out, but since you invited Love, wherever He goes, we go with him....that's it..."

So remember..... Wherever there is Love, there is also Wealth and Success....!

♦ **Deepa Sandamali Herath - USA**

## පාරිසරික ඇමතිතුමාට මල්මිටක්!



**ර**ටේ ප්‍රශ්න ද, අහස උසට නගින බඩුමිළ ද ජනමාධ්‍යයෙන් නිතර සාකච්ඡා කෙරේ. යුද්ධය නිමවන්නට නම් එදිනෙදා වන දුෂ්කරතා ගැන නොසිතා ජනතාව පටි තද කරගත යුතු බව ද ඉහළින් කියැවේ. ඒ සමගම මැති ඇමතිවරුන්ට මිලියන ගණන් වැයකර අධි සුඛෝපභෝගී වාහන ගෙන්වන කතා ද ඇසේ. මැති ඇමතිවරු විශාල කණ්ඩායම් රාජ්‍ය තාන්ත්‍රික සංචාරයන් සඳහා යනවිට කෙරෙන වියදම රුපියල් මිලියන වලින් ගණන් බලා ඇත. මේ සියල්ල තුළින් ජනතාවට වැටහී ඇත්තේ දේශපාලකයින් රටේ මුදල් නාස්ති කරන බවයි. කරුණු මෙසේ නමුත් මේ අතරේ සිත සතුටුවන පුවතක් ද ඇසන්නට ලැබිණ. ඒ මෙයයි.

මේ නොබෝදා ශ්‍රීලංකා ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ සමුළුවට ගිය ගමනට සහභාගිවූ පිරිස අතර ජාතික හෙළ උරුමය නියෝජනය කරන, එමෙන්ම වත්මන් රජයේ පාරිසරික හා ස්වාභාවික සම්පත් ඇමතිධුරය උසුලන පාඨලී චම්පික රණවක මහතාද විය. ඒ මහතා වියහියදම් බොහෝ අඩුවන සේ සුපිරි විශේෂ පන්ති මගහැර, සාමාන්‍ය පන්තියේ ගුවන්ගමන් හා නැවතීමේ පහසුකම් ලබමින්, ඉතා අරපිරිමැසුම් සහිතව වියදම්කර, තමා වෙනුවෙන් වෙන්කළ මුදලින් ඇමරිකානු ඩොලර් 2100 ක් ඉතිරිකර ආපසු ශ්‍රීලංකා භාණ්ඩාගාරයට බාරදී ඇත. මුළු රටටත් විශේෂයෙන් සෙසු මැති ඇමතිවරුන්ටත් ආදර්ශයක් වන චම්පික රණවක ඇමතිතුමාගේ එම උසස් ක්‍රියාවට එතුමන්ට අප කාගේත් ප්‍රශංසාව හිමිවිය යුතු ය.

♦ **කරුණා බස්නායක** Hampstead **UK**






**මහ කොටිය සුවසේ නිදි.....දොයි... දොයි...**

## ප්‍රභාකරන් ඇත / නැත

**ම**හා බ්‍රිතාන්‍යයේ උඩ කොටස ස්කොට්ලන්තයයි. (සිතියම ළඟ ඇත්නම් අරගෙන බලන්න) ඒ උඩත්, උඩම මුදුන ඉන්වර්නස් කියන ප්‍රදේශය. ඒ ඉන්වර්නස් අවුරුදු ගණනාවක් පුරා ප්‍රසිද්ධ වෙලා තියෙන්නෙ මකරෙක් නිසා. ඒ මකර ගෑණු මකරෙක්. නම ලොක්නස්. ඒ පළාතෙ ස්කොට්ෂ් ජාතිකයො මේ මකරට ආදරෙයි. ස්කොට්ෂ් භාෂාවෙන් ලොක් කියන්නෙ විල ට නැත්නම් කුඩා ගඟකට කියන වචනය. නෙස් කියන්නෙ හුරු බුහුටි කෙල්ල කියන තේරුම. ලොක්නස් කියන්නේ විලේ ඉන්න තරුණිය. වැඩි ආදරේට ඒ පළාතෙ මේ මකරට කියන්නෙ **අපේ කෙල්ල** කියලා. **අවර් නෙසී** කියලයි.

මේ ලොක්නස් මකරා බොරු මනඃකල්පිත සතෙක් හැටියට බොහෝ දෙන හැඳින් වුවත් ස්කොට්ෂ් ජාතිකයො කියන්නෙ ඇත්තටම එහෙම සතෙක් ඒ ලොක්නස් විලේ ඉන්නා බව. ඒ අය කැමති නැහැ එහෙම කෙනෙක් නැති බව විස්වාස කරන්න. ඒ නෙසී ගැන ගෙතුණු කතා අපමණයි. ඒ නෙසීගෙ කතා කිය කිය තමයි පුංචි කාලෙ ඒ පළාතෙ ළමයින්ට කෑම කවන්නේ. ඉතින් ඒ ළමයි වැඩිහිටියො වුනාමත් ලොක්නස් මකර නෑ කියලා හිතට එන්නෙම නෑ. ඒ තරමට ලොක්නස් මකරා ඔවුන්ගේ ආත්මය බවට පත්වෙලා. මේ මකරගෙ රූප, චිත්‍ර, කවි, කතා, පින්තූර පොත්, විඩියෝ, කාටූන් එමට. ඒවා ඉන්වර්නස් වලට ආදායම ගේන මාර්ග. ලොක්නස් නැහැයි පිළිගැනීම ඒ පළාතට බඩේ පාර වැදීම. ලොක්නස් මකරා දැකපු අයත් ස්කොට්ලන්තෙ ඉන්නවා. සමහරු මාළු බාන්න ඒ විලට හැන්දෑවෙ ගියාම වතුර යටින් ඇවිත් විසාල සතෙක් මතු වුනාලු. කිසි කරදරයක් නොකර ආපහු ගියාලු. ඔය වගේ කතා එමට.

මේ ලොක්නස් මකරා වගේ නේද කොටි ත්‍රස්තවාදීන්ගෙ නායක මහ කොටියා ප්‍රභාකරන්. හුඟක් සමානකම් තියන විත්තිය මට කල්පනා වුණා.

තවම කවුරුවත් හරියට දන්නෙ නැහැ මූ ඉන්නවද, නැද්ද කියලා. සමහරු කියනවා ප්‍රභාකරන් මැරිලය, මැරුණෙ අවුරුදු ගණනකට ඉස්සෙල්ලා හැංගිලා ඉන්න බංකර් එකට ආපු පොළඟෙක් දෂ්ට කරලාලු. තව කතාවක් තමයි ප්‍රභාකරන් පහුගිය සුනාමිය දවසෙ කිලිනොච්චියෙ පල්ලියක නත්තල් දවසෙ රෑ පූජාවට ගිය වෙලාවෙ සුනාමියට අහු වෙලා ගහගෙන ගියයි කියන එක. ප්‍රභාකරන්ගෙ බිරිඳ ළමයි දෙන්නත් අරන් පිටරට ගියෙත් ඒ නිසාලු. ඔය කතා අනන්තයි. එතකොට මේ කොටි වීර දිනයට කතාව පවත්තන ප්‍රභාකරන් කවුද? ආ.... ඒ මැන් වගේම මහත, උඩුරැවුල වවපු වෙන කොටියෙක්ලු. ඒ වගේ කොටි පස් දෙනෙක් ඉන්නවයි, එක එක කාලෙට කොටි සංවිධානෙ මේ මහත කොටියෙක් ඉස්සරහට දානවයි මේ තමයි ප්‍රභාකරන් කියලා. තව මතයක් තමයි, ඇත්ත ප්‍රභාකරන්ගෙ කණේ මවිල් ගස් කීපයක් සහ, ඉස්සරහ දත් දෙක අතරෙ හිඩැසක් තියන බව. ඒක අහුවෙන හන්දලු දැන් ඉන්න එකා හිනාවෙන්නෙ නැතුව බුම්මගෙන ඉන්නෙ. ඒකටත් එක්කලු තමිල් වෙල්වම් පොල් කැල්ල පෙන්නලා හැම තිස්සෙම හිනාවුණේ.

මේ කතා කොහොම වුනත් ඇත්ත කාරණාව තමයි දැනට කොටි හමුදාවෙ ඉන්න සාමාජිකයන්ගෙනුත් තුන් කාලක්ම ප්‍රභාකරන් කවුද කියල හරියට දැකලා නැහැ. පිටරටවල ඉන්න දෙමළ අයගෙන් දහ දෙනෙක්වත් ඌව හැබැහින් දැකලා නැහැ. දැකලා තියෙන්නෙ පින්තූරෙන්. දෙමළ කොටි ප්‍රචාර වලින් තමයි සංවිධානෙ පුම්බලා තියන්නෙ. එහෙම නොකළා නම් කොටින්ගේ බැංකුවට සල්ලි වැටෙන්නෙ නෑ. කොටි තවම කියන්නෙ හෙට ඊළම් රාජ්‍යය හදන බව. ඒක මේ සම්ම ජාතියෙ වෙන්නෙ නෑ කියලා උනුත් දන්නවා.

ප්‍රභාකරන් ඇත්තටම හිටියත් දැන් යන්න කාලෙ හරි බවයි කවුරුත් කියන්නෙ. ඒක අද හෙටම වෙන්න පුළුවන්. එදාට මුළු කොටි සංවිධානෙ අල්පෙනෙත්තකින් ඇන්න බැලුමක් වගේ හුළං බැහැලා, ඇකිලිලා පැත්තකට වැටේවි. එදාට කිලිනොච්චියට විතරක් නෙවෙයි මුළු ලංකාවටම ඇත්ත ඉර පායාවි.

♦ **වෙලේගෙදර රාළ London**